# LEARNING RECOVERY PLAN

**විෂය** Subject - පෙරදිග සංගීතය

**ශ්‍රේණිය** Grade - 8

**කාලච්ඡේද** Periods - 60

| | **නිපුණතාවය** Competency | **ක්‍රියාකරකම** Activity | **අත්‍යවශ්‍ය ඉගෙනුම් පල** Essential Learning Outcomes | **විෂය අන්තර්ගතය** Subject Content | **කාලච්ඡේද** Periods |
|---|---|---|---|---|---|
| 7 ශ්‍රේණියෙන් | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 3 | • සංගීත ප්‍රායෝගික දක්ෂතාවන්හි මූලාරම්භය සප්තකයේ නිවැරදි ගායනය බව වටහා ගනියි.<br>• ශුද්ධ ස්වර සප්තකය තනි තනිව ගයමින් ගායන හැකියා ප්‍රදර්ශනය කරයි.<br>• ස්වර සප්තකයේ ස්වර අතර අන්තර වටහා ගත හැකි අයුරින් ගොඩ නැගූ දෘශ්‍ය උපකරණයක්.<br>ස්වර පුවරු භාණ්ඩයක් හෝ සුදුසු ස්වර වාද්‍ය භාණ්ඩයක් | ස්වර සප්තකය ගායනය | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 6 | • ප්‍රස්තාරකරණයේ සුවිශේෂතා හඳුනා ගනියි.<br>• ප්‍රස්තාර කිරීමේ දී අනුගමනය කරනු ලබන පිළිවෙළ පිළිබඳ ව විස්තර කරයි.<br>• සංගීත අධ්‍යාපනයේ දී ගීත වාදිත ප්‍රස්තාර මූලික වන බව පිළිගනියි.<br>• ප්‍රස්තාර සරල ව කියවීමේ හුරුව ලබයි.<br>ප්‍රස්තාර කිරීමේ දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | ස්වර ස්ථාපන ගීත ප්‍රස්තාර | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 13 | • උපදේශාත්මක ගී පිළිබඳ ව අදහස් දක්වයි.<br>• උපදේශාත්මක ගීත ලැයිස්තු ගත කරයි.<br>• එම ගීත ගයන ගායක ගායිකාවන් නම් කරයි.<br>• උපදේශාත්මක ගීත ගායනයට කැමැත්තක් දක්වයි.<br>• එම ගීතවල පද මාලාවන් ප්‍රකාශ වන අදහස විස්තර කරයි.<br>• උපදේශාත්මක ගීතයක් දෙකක් ගායනය කරයි. | උපදේශාත්මක ගීත රසාස්වාදය සහ ගායනය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 15 | • ස්වර ඥානය වර්ධනය කර ගනියි.<br>• ස්වර වල ස්ථානීය අගය වටහා ගනියි.<br>• ස්වර අභ්‍යාස ගායනයට පෙළඹෙයි.<br>• කෝමළ ග නි ස්වර නිවැරදිව ගායනය කරයි. | කෝමළ ස්වර අභ්‍යාස | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 18 | • භාණ්ඩයේ ස්වරූපය වටහා ගනියි.<br>• ස්වර පිහිටීම වටහා ගෙන ස්වර අෂ්ටකය වාදනය කරයි. | තෝරා ගත් භාණ්ඩයේ ස්වභාවය හා ස්වර පිහිටීම | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 19 | • ශුද්ධ ස්වරඅභ්‍යාස වාදනය කරයි.<br>• තාලානුකූල රිද්ම රටා හඳුනා ගනියි.<br>• ස්වරස්ථාන නිවැරදිව වැයීමට හුරු වෙයි.<br>• නිවැරදි ඉරියව්වෙන් වාදනය කරයි. | වාද්‍ය භාණ්ඩයෙන් තාලානුකූල ස්වර අභ්‍යාස වාදනය | 03 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 21 | • ප්‍රස්තාරකරණයේ ආරම්භක ස්ථානය ග්‍රහය ලෙස පැහැදිලි කරයි.<br>• විවිධ ග්‍රහ අවස්ථාවන් නම් කරයි.<br>• ඒ සඳහා උචිත ගී පාද ඉදිරිපත් කරයි.<br>ග්‍රහයන් දෙඅත්ලෙන් පෙන්වමින් එම ගීත ගයයි. | ප්‍රස්තාරකරණයේ විශේෂිත අවස්ථා (සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ) | 02 |
| | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 22 | • නූර්ති ගීත ගායනය කරයි.<br>• ප්‍රචලිත නූර්ති ගීත එකතු කරයි.<br>• නූර්ති ගීත ශ්‍රවණයට කිරීමට කැමැත්තක් දක්වයි. | නූර්ති ගීත ගායනය | 02 |
| | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 23 | • කෝලම් ගීත ගායනය කරයි.<br>• කෝලම් නාට්‍ය චරිත හඳුනා ගෙන, ගීත ගයමින්, රංගනය කරයි. | කෝලම් ගීත ගායනය සමග සරල ව රංගනය කිරීම | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 24 | • ජන මාධ්‍ය මගින් හා ශ්‍රව්‍ය පට මගින් ඇසෙන ළමා ගීතවලට සවන් දෙයි.<br>• නිර්දේශිත ළමා ගීතය ගායනය කරයි.<br>• එම ගීතයෙන් ප්‍රකාශ වන අදහස පිළිබඳ ව සාකච්ඡා කරයි.<br>• ගීතයේ අදහසට ගැළපෙන නාද මාලාව සහ රිද්මයෙහි සරල බව අගය කරයි.<br>• එවැනි වෙනත් ළමා ගීත සෙවීමට පෙළඹේ. | ළමා ගීත අගය සහ ගීතයේ ප්‍රබලතාවය | 01 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 25 | • දරු නැළවිලි ගීත හඳුනා ගනිමින් ගායනය කරයි.<br>• සාම්ප්‍රදායික නාදමාලාවන්ට අනුව ගීත ගායනය කරයි. | දරු නැළවිලි ගී ගායනය කරමු | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 26 | • රබන් ගී හඳුනා ගනිමින් ගායනය කරයි.<br>• සාම්ප්‍රදායික නාදමාලාවන්ට අනුව ගීත ගායනය කරයි. | රබන් ගී ගායනය කරමු | 01 |
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 28 | • පද බැඳීම් සඳහා සුදුසු විවිධ සංකල්පනා නම් කරයි.<br>• තම චින්තන හැකියාව යොදමින් එම සංකල්පනා ගී පද ලෙස නිර්මාණය කරයි.<br>• ගීතයකට උචිත ලෙස එම පදවැල් රිද්මයකට පෙළ ගසයි.<br>• එම පද වැලෙන් කියැවෙන අරුත වටහා ගනී.<br>• ගී පද නිර්මාණ රස විඳියි. | පද නිර්මාණය | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 32 | • සිසුවා විසින් සපයා ගත් භාණ්ඩය වාදනය කිරීමේ හැකියාව වර්ධනය කර ගනියි.<br>• නිවැරදි ස්වර කණට හුරුවෙයි.<br>• විවිධ රිද්ම රටා හඳුනා ගනියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්හි යෙදෙයි.<br>• ශුද්ධ ස්වර ස්ථාපන ගී වාදනය කරයි. | ස්වර රටා වාදනය (ශුද්ධ ස්වර ස්ථාපන ගී) | 02 |
| | නිපුණතාව 4.0 | ක්‍රියාකාරකම 35 | • දූල් ගීත ගායනය කරයි.<br>• දූල් ගීත පිළිබඳ තොරතුරු අවබෝධ කර ගනියි. | දූල් ගී ගායනය සහ දූල් ගී පිළිබඳ තොරතුරු | 01 |
| | **කාලච්ඡේද එකතුව** | | | | **24** |
| | **නිපුණතාවය** Competency | **ක්‍රියාකරකම** Activity | **අත්‍යවශ්‍ය ඉගෙනුම් පල** Essential Learning Outcomes | **විෂය අන්තර්ගතය** Subject Content | **කාලච්ඡේද** Periods |
| **8 ශ්‍රේණිය** | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 1 | • බිලාවල් රාගයේ යෙදෙන ස්වර හඳුනා ගනියි.<br>• ස්වර ස්ථාපන ගී ගායන ආධුනිකයකුට වැදගත් වන බව පිළිගනියි.<br>• බිලාවල් රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.<br>• බිලාවල් රාගයේ ස්වර නිවැරදිව ගයයි.<br>• රාගධාරී සංගීතය හැදෑරීමට පෙලඹෙයි. | බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 2 | • මාත්‍රා, විභාග, තාලස්ථාන, ආවර්ත යන පාරිභාෂික පද පැහැදිලි කරයි.<br>• එම කොටස් තාලයක පිහිටන අයුරු විස්තර කරයි.<br>• තාල හා සම්බන්ධ ප්‍රායෝගික අවස්ථාවල දී එක් එක් කොටසේ ඇති වැදගත්කම පිළිබඳ තර්ක කරයි. | තාලයක කොටස් | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 3 | • මිශ්‍ර මත් කැටි සහිත හින්දුස්ථානි තාල පද නම් කරයි.<br>• එම තාල පද හඳුන්වයි.<br>• ඣප්තාල්, දීප්චන්දි තාල අතින් නිරූපණය කරයි.<br>• නියමිත තාල පද වෙන් කොට දක්වයි.<br>• තාල අතින් නිරූපණය කර පෙන්වයි. | හින්දුස්ථානී තාල පද (ඣප්තාල් - දීප්චන්දි) | 01 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 4 | • ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය කරයි.<br>• තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳ ප්‍රායෝගිකව අත්දැකීම් ලබා ගනී.<br>• ගීත වාදනය කිරීමේ හැකියාව ලැබීමෙන් තම ජීවිතයට වටිනාකම් ලැබුණු බව දැන සතුටු වේ.<br>• තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙය | ස්වර පුවරුවෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 5 | • ස්වර වාද්‍ය භාණ්ඩයන්හි ස්වර ඉපදවීම පිළිබඳ ව හුරුව ලබා ගනියි.<br>• තමා වයන වාද්‍ය භාණ්ඩයේ හස්ත සාධන ක්‍රම හඳුනා ගනියි.<br>• හස්ත සාධන අභ්‍යාස වාදනය කිරීම මගින් වාදන හැකියාවන් දියුණු කර ගනියි.<br>• වාදන හැකියාව මගින් තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙයි. | ස්වර වාද්‍ය සඳහා හස්ත සාධන අභ්‍යාස | 02 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 6 | • ස්වර වාද්‍ය භාණ්ඩයෙන් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය කරයි.<br>• ස්වර වාද්‍ය භාණ්ඩයෙන් ශුද්ධ ස්වර නිවැරදි ව වාදනය කිරීමට පුහුණු වෙයි.<br>• තාලය ලය රිද්මය විභාග මාත්‍රා වැනි කරුණු පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනියි.<br>• ගීත වාදනය කිරීමේ හැකියාව ලැබීමෙන් ජීවිතයට වටිනාකම් ලබා ගනියි.<br>• තමා ජීවත් වන සමාජ තුළ ඇගයීමට ලක්වන අයකු බවට පත් වෙයි. | ස්වර වාද්‍ය භාණ්ඩය මගින් ශුද්ධ ස්වර සහිත ගීත වාදනය | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 9 | • ගොයම් ගීත ගායනය කරයි.<br>• දේශීය අනන්‍යතාව පැහැදිලි වන මෙම ගීතවල වටිනාකම අගය කරයි.<br>• සාමූහික බව දනවන ගීත විශේෂයක් බව පිළිගනියි.<br>• ගොයම් කැපීමේ දී ගයන ගීත විශේෂයක් බව ප්‍රකාශ කරයි. | ගොයම් ගී ගායනය | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 11 | • නව නාට්‍ය ගීත ගායනය කරමින් රස විඳියි | නව නාට්‍ය ගී ගායනය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 12 | • භූපාලි රාගයේ යෙදෙන ස්වර හඳුනාගනියි.<br>• සංගීත අධ්‍යාපනයේ ආධුනිකයකු ලෙස ස්වර ස්ථාපන ගී ගායනයේ වටනාකම පිළිගනියි.<br>• භූපාලි රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.<br>• භූපාලි රාගයේ ස්වර නිවැරදි ව ගයයි.<br>• රාගධාරී සංගීත අධ්‍යාපනයට පෙලඹෙයි. | භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 16 | • සරල ගීතයක බස හා ආකෘතිය පිළිබඳ අදහස් දක්වයි.<br>• සරල ගීතයක අන්තර්ගත කොටස් හඳුන්වයි.<br>• ශ්‍රවණය මගින් සරල ගීතයක කොටස් වෙන්කර ගැනීමේ හැකියාව ලබයි.<br>• එකිනෙක කොටස් අතර සම්බන්ධතා දකිමින් රස විඳියි. | සරල ගීතයක කොටස්, බස සහ ආකෘතිය | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 17 | • භජන් ගී ගායනය කරයි.<br>• භජන් ගී ශ්‍රවණයට කැමැත්තක් දක්වයි.<br>• විවිධ ශිල්පීන්ගේ භජන් ගී එකතුවක් කිරීමට පෙලඹෙයි. | භජන් ගී ගායනය | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 18 | • නෙළුම් ගීත ගායනය කරයි.<br>• නෙළුම් ගීත පිළිබඳ විස්තර කරයි.<br>• නෙළුම් ගී සංස්කෘතික අංගයක් ලෙස අගය කරයි.<br>• නියමිත ලය පවත්වා ගනිමින් ගයයි. | නෙළුම් ගී ගායනය | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 19 | • කමත් ගී ගායනය කරයි.<br>• කමත් ගී පිළිබඳ ව විස්තර කරයි.<br>• කමත් ගී කඩිනම් ලයකින් ගයන බව පිළිගනියි.<br>• කමත් ගීවල සංස්කෘතික ලක්ෂණ විස්තර කරයි.<br>• කමත් ගීවල අඬහැර පෑම සුවිශේෂ අංගයක් ලෙස අගය කරයි. | කමත් ගී ගායනය | 01 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 20 | • ගැමි ගී යන්න නිර්වචනය කරයි.<br>• ගැමි ගී නිර්මාණයට පදනම් වූ හේතු සාධක නම් කරයි.<br>• ගැමි ගීයේ සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>• ගැමි ගී, සේ ගී සංසන්දනය කරමින් ගැමි ගීයේ ලක්ෂණ තෝරයි. | ගැමි ගීයේ විශේෂ ලක්ෂණ | 01 |
| | නිපුණතාව 5.0 | ක්‍රියාකාරකම 21 | • දමිළ ගී ගායනය කරයි.<br>• දමිළ ගී ගායනයට කැමැත්තක් දක්වයි.<br>• වෙනත් භාෂාවකින් රචිත ගීත රස විඳියි. | දමිළ ගී ගායනය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 5.0 | ක්‍රියාකාරකම 22 | • පිය ගුණ ගීයක් හැඟීම්බර ව ගායනය කරයි.<br>• ගී පද මාලාව අගය කරයි.<br>• පිය ගුණ ගීත නිර්මාණයට පෙලඹේ. | පිය ගුණ වරුණ ගීතයක් ගායනය | 01 |
| | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 24 | • නාඩගම් ගීත ගායනය කිරීමේ කුසලතාව ලබයි.<br>• නාඩගම් ගීත වාදනය කිරීමේ කුසලතාව ලබයි. | නාඩගම් ගීත ගායනය | 01 |
| | නිපුණතාව 6.0 | ක්‍රියාකාරකම 25 | • රංග ශෛලීන් අනුව නාඩගම් හා නූර්ති රංග සම්ප්‍රදායයන් පිළිබඳ අවබෝධයක් ලබයි.<br>• නාඩගම් හා නූර්තිවල සංගීතමය වෙනස්කම් හා විශේෂ ලක්ෂණ හඳුනා ගනියි. | නාඩගම් සහ නූර්ති රංග සම්ප්‍රදායයන්හි ශෛලිය, සංගීතය හා විශේෂතා | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 26 | • සඳැස් මත් හා ගී මත් යනු විස්තර කරයි.<br>• සඳස් මත් ගණන ගායනයේ දී වෙනස් විය හැකි බව පිළිගනියි.<br>• සඳැස් මත්, ගීමත් ගණනය කරයි.<br>• අප අසන ගීවල ලිඛිත පද, ගායනයේ දී තාලයට අනුගත වන අයුරු විමසයි.<br>• ගායනයට උචිත වන සේ මාත්‍රා පිහිටුවා ගී පද නිර්මාණය කරයි.<br>• ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කිරීමේ දී සඳැස් මත්වල හා ගීමත්වල දැනුම ප්‍රයෝජනවත් වන අයුරු පිළිබඳව අදහස් දක්වයි. | සඳැස් මත් සහ ගී මත් | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 27 | • යතිය යනු පැහැදිලි කරයි.<br>• පැදියක යති යෙදෙන ස්ථාන පැහැදිලි කරයි.<br>• යතියක් යෙදීමේ වාසි දක්වයි.<br>• යති සහිත ගී පද ප්‍රස්තාර කරයි. | යතිය සහ යති සහිත ගී පද ප්‍රස්තාර | 01 |
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 28 | • රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු විස්තර කරයි.<br>• රේඛා මණ්ඩලය මත පිහිටන ස්වර ලකුණු කිරීම සඳහා යොදා ගන්නා සංකේත නම් කරයි.<br>• එක් එක් සංකේතයට අයත් මාත්‍රා සහ වටිනාකම් පැහැදිලි කරයි.<br>• රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර හත ස්වර ලකුණු කරයි. | රේඛා මණ්ඩලය මත ස්වර පිහිටන අයුරු | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 8.0 | ක්‍රියාකාරකම 29 | • රේඛා මණ්ඩලය මත පිහිටන ස්වර පිළිබඳ විස්තර කරයි.<br>• බටහිර ප්‍රස්තාර ක්‍රමයට අනුව එක් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට භාවිත කරන සංකේත නම් කරයි.<br>• එම සංකේතවල එකිනෙක වෙනස්කම් පැහැදිලි කරයි.<br>• බටහිර ප්‍රස්තාර ක්‍රමය පිළිබද අවබෝධය ලෝක සංගීතය හඳුනා ගැනීමට අවශ්‍ය බව පිළිගනියි.<br>• රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර ඇතුළත් සරල ස්වර ප්‍රස්තාරයක් ලකුණු කරයි. | බටහිර ප්‍රස්තාරයක දී ස්වර සඳහා යොදා ගනු ලබන විවිධ සංකේත සහ වටිනාකම් | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 30 | • කාෆි රාගයේ යෙදෙන ස්වර හඳුනාගනියි.<br>• සංගීත අධ්‍යාපනයේ ආධුනිකයකු ලෙස ස්වර ස්ථාපන ගී ගායනයේ වටනාකම පිළිගනියි.<br>• කාෆි රාගයට අයත් ස්වර ස්ථාපන ගීතයක් ගයයි.<br>• කාෆි රාගයේ ස්වර නිවැරදි ව ගයයි.<br>• රාගධාරී සංගීත අධ්‍යාපනයට පෙලඹෙයි. | කාෆි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීත | 02 |
| | නිපුණතාව 1.0 | ක්‍රියාකාරකම 31 | • මිශ්‍ර මත් කැටි සහිත දේශීය තාල පද නම් කරයි.<br>• දතිතට අයත් තාල පද උඩ-පහත-සබරගමු වශයෙන් විවිධ වන අයුරු සහ වෙනස දක්වයි.<br>• දෙතිතට අයත් උඩ-පහත-සබරගමු තිත් තාල පද නම් කරයි.<br>• තාලය යන්න විශ්වයටම පොදු සංකල්පයක් බව පිළිගනියි.<br>• දෙතිතට අයත් තිත්තාල පද අතින් නිරූපණය කරයි. | දෙතිතට අයත් තිත් තාල පද | 01 |
| | නිපුණතාව 2.0 | ක්‍රියාකාරකම 35 | • රවීන්ද්‍ර ගීත ශ්‍රවණයට කැමැත්තක් දක්වයි.<br>• රවීන්ද්‍ර ගීත රසාස්වාදනයේ යෙදෙයි. | රවීන්ද්‍ර ගීත ගායනය | 01 |
| | නිපුණතාව 3.0 | ක්‍රියාකාරකම 37 | • කිතුනු බැති ගී ශ්‍රවණයට කැමැත්තක් දක්වයි.<br>• කිතුනු බැති ගී හා බොදු බැති ගී අතර වෙනස්කකම් දක්වයි | කිතුනු බැති ගී ගායනය කරයි | 01 |
| | නිපුණතාව 5.0 | ක්‍රියාකාරකම 38 | • මවුගුණ ගීයක් ගායනය කරයි.<br>• මවු සෙනෙහස පිළිබඳ අදහස් දක්වයි.<br>• තෝරාගත් ගීතයෙහි පද මාලාව අගය කරයි.<br>• පිය ගුණ ගීත නිර්මාණයට පෙලඹේ. | මවු ගුණ වරුණ ගීතයක් ගායනය | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිපුණතාව 7.0 | ක්‍රියාකාරකම 42 | • තනු නිර්මාණයේ සරල අවස්ථාවක යෙදී අත්දැකීම් ලබයි.<br>• සරිගමපධනි යන ස්වර ඇසුරින් කරන තනු නිර්මාණයක දී ''ස'' ස්වර අත්‍යවශ්‍ය බව පිළිගනියි.<br>• එක ස්වරයකින් වුවත් තනුවක් සෑදිය හැකි බව පිළිගනියි.<br>• තනුව ඇරඹීමේ දී කෙසේ වෙතත් අවසානයේ දී ''ස'' ස්වරයෙන් අවසන් වීම බොහෝ ගීතවල සම්ප්‍රදායය බව පිළිගනියි.<br>• සරල තනුවක් නිර්මාණය කර ආත්මාභිමානයක් ලබයි. | රිද්ම රටාවකට ස්වර යෙදීම | 02 |
| | **කාලච්ඡේද එකතුව** | | | | **36** |